5104

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2016** 1.12.2016
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 |

නම :- .................................................................. විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

- ප්‍රශ්න පත්‍රය I හා II යන කොටස්වලින් සමන්විතයි. I කොටසේ සියලුම ප්‍රශ්න වලටද, II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.

De Mazenod College Kandana

## I කොටස

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) නාට්‍යයක් නැරඹීමෙන් අපගේ ජීවිතයට ලද හැකි වඩාත්ම වැදගත් අත්දැකීම මින් කුමක් ද?
- (i) නාට්‍යමය අවස්ථාවෙහි අපූර්වත්වය තුලින් රසවින්දනයක් ලද හැකිවීම.
- (ii) නාට්‍යමය අත්දැකීම ජීවිත ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා සහය කරගත හැකිවීම.
- (iii) නාට්‍ය ශිල්පීය ක්‍රම භාවිතය පිළිබඳ අවබෝධයක් ලද හැකිවීම.
- (iv) නළු නිළියන් හඳුනාගත හැකිවීම.

(02) කටහඬ අභ්‍යාස සඳහා සුදුසුම ක්‍රියාවක් වන්නේ මින් කුමක් ද?
- (i) ගුවන් විදුලි නාට්‍යවලට සවන් දීම
- (ii) ජාතක පොත කියවීම
- (iii) ශාන්ති කර්ම ගී ගායනා කිරීම
- (iv) රංග ක්‍රීඩාවල යෙදීම

(03) පන්ති කාමරයේදී ඔබ කණ්ඩායමට කිසියම් උපකරණයක් ලබා දී එය ආශ්‍රයෙන් "නිර්මාණාත්මක ක්‍රියාකාරකමක්" ඉදිරිපත් කිරීමට උපදෙස් ලැබුණි. මෙම ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය වන්නේ මින් කුමක් ද?
- (i) පරිකල්පන හැකියාවය
- (ii) අනුකරණ හැකියාවය
- (iii) රූපණ හැකියාවය
- (iv) ඉදිරිපත් කිරීමේ හැකියාවය

(04) රංග විධාන සම්බන්ධව වැරදි කියමන කුමක් ද?
- (i) නාට්‍ය පෙළක වරහන තුල දක්නට ලැබෙන වචන
- (ii) අධ්‍යක්ෂවරයාට දෙන ලද උපදෙස්
- (iii) නළු නිළියන්ට රංග කාර්යයට ලබාදෙන උපදෙස්
- (iv) රංග අභ්‍යාස සඳහා දෙන අණ

(05) ආනුෂංගික කලාවන් සඳහා අයත් නොවන්නේ කුමක් ද?
- (i) ආලෝකකරණය
- (ii) වේෂ නිරූපණය
- (iii) රූපණය
- (iv) සංගීතය

(ලකුණු 05)

- වරහන් තුළ දී ඇති වචන නිවැරදිව යොදා හිස්තැන් පුරවන්න.

ජාතක කථා ඇසුරු කොට ගනිමින් බොහෝ නාට්‍යය නිර්මාණය වී ඇත. ඒ අනුව සේරි වාණිජ ජාතකය ඇසුරින් (06) .................................. නාට්‍ය නිර්මාණය වී ඇත. එහි නිෂ්පාදකයා වූයේ (07) .................................. ය. චුල්ල ධනුද්දර ජාතකය ඇසුරින් (08) .................................. නාට්‍ය නිර්මාණය කරන ලදි. ප්‍රවීන නාට්‍යවේදී සුගතපාලද සිල්වා නිෂ්පාදනය කල (09) .................................. නාට්‍යය කතෝලික ආගම පසුබිම් කරගත් පාස්කු නාට්‍යයකි. ආගමික කථා මත ගොඩ නැගුණු නාට්‍ය නිසා සමාජය තුල (10) .................................. පිරිපුන් පරිසරයක් ගොඩ නගා ගත හැකිය.

(සාන්තුවර සෙබලානෝ, සාරධර්මවලින්, කදා වළලු, එදිරිවීර සරත්චන්ද්‍ර, මනමේ)

(ලකුණු 05)

- "A" කොටසෙහි දක්වා ඇති අදහසට ගැලපෙන පිළිතුර "B" කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| (11) නරි බෑණා | 1. නීතිඥ ජෝන්ද සිල්වා |
| (12) නාට්‍ය පෙළක කථා වස්තුවෙන් ප්‍රකාශ වන අදහස | 2. දයානන්ද ගුණවර්ධන |
| (13) රාමායනය | 3. සෝබාව දේ මෙපුර |
| (14) ශරීරය සැහැල්ලු කරන අභ්‍යාසය | 4. තේමාව |
| (15) තාරාවෝ ඉගිලෙති | 5. ශිථිලකරණය |

(ලකුණු 05)

- පහත දක්වෙන වගුව ආශ්‍රය කරගෙන අසා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි අක්ෂරය තෝරා තිත් ඉරිමත ලියන්න.

| | | | |
|---|---|---|---|
| A | සර්පිනාව | B | සැක්ස ෆෝනය |
| C | බලංගොඩ | D | අම්බලන්ගොඩ |
| E | සෙල්ලං ලෙල්ලං | F | වළහා හා මාෂා |
| G | චිත්‍ර වස්ත්‍ර | H | මපට් |

(16) රූකඩ සඳහා ප්‍රචලිත ප්‍රදේශයකි ..................................

(17) රූකඩ හා සම්බන්ධ වාද්‍ය භාණ්ඩයකි ..................................

(18) රූකඩ කලාවේ පසුතල නිර්මාණ සඳහා යොදා ගනී ..................................

(19) නරක අයට පවා කරදරයකදී උදව් කල යුතුය ..................................

(20) නරක ගතිවලින් යුක්ත අයෙක් වුවද, පරිසරය හා ආශ්‍රය කරන්නන්ගේ බලපෑමෙන් වෙනස් විය හැකිය. ..................................

(ලකුණු 05) (I කොටස ලකුණු 20 යි.)

## II කොටස

* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.)

(01) මේන් ගෙනාවා - මේන් ගෙනාවා
වළලු තියෙනවා - මාල තියෙනවා
හැම දාම නෑ - හැම තැනම නෑ
රෑං කියනවා - උඩ ඉගිලෙනවා

(i) මෙම ගීත කාණ්ඩය ඇතුලත් නාට්‍යය කුමක් ද? (ලකුණු 01)
(ii) එය ගායනා කරනු ලබන චරිතය කුමක් ද? (ලකුණු 01)
(iii) ඔහු තුලින් ප්‍රධාන වශයෙන්ම ඉස්මතුවන චරිත ලක්ෂණයක් ලියන්න. (ලකුණු 01)
(iv) එම ගීත කාණ්ඩය ගායනා කිරීමෙන් පසු ඔහු හා සංවාදයට එක් වන්නේ කවුරුන් ද? (ලකුණු 01)
(v) එම චරිතය කෙබඳු චරිතයක් ද? (ලකුණු 01)
(vi) එම අවස්ථාවේ දී ඔහු තමාට අවශ්‍ය යැයි පවසන්නේ කුමක් ද? (ලකුණු 01)
(vii) එම ඉල්ලීමට හේතු වූයේ කුමක් ද? (ලකුණු 01)
(viii) මෙම නාට්‍යයෙන් කියැවෙන නිවසේදී ළමයෙකු සතුවිය යුතු වගකීමක් සඳහන් කරන්න. (ලකුණු 01)
(ix) මෙම නාට්‍යයට අනුව ළමයින් කරදර හා දුකට පත්වන අවස්ථා මඟහැර ගැනීම සඳහා ක්‍රියාකල යුතු ආකාර 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

(02) "අන්දම් කරුවලේ සොහොනේ සිටින්නේ
අන්දමකින් රෑ සිහිනෙන් පෙනෙන්නේ
පන්දම් යගදාව ගෙන කරකවන්නේ
පන්දම් පාලියට සන්නිය වරෙන්නේ"

(i) මෙම කවිය අයත් ශාන්ති කර්මය කුමක් ද? (ලකුණු 02)
(ii) ප්‍රධාන ශාන්ති කර්ම වර්ග 3ක් නම්කර, ඒ එක් එක් ශාන්ති කර්ම වර්ගය සඳහා වාදනය කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) ශාන්ති කර්ම ගීත පිලිබඳව කෙටි හඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

(03) (i) නාට්‍ය පෙළක් යනු කුමක් ද? (ලකුණු 02)
(ii) නාට්‍ය පෙළක තිබිය යුතු මූලික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) නාට්‍ය නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

(04) පහත දැක්වෙන කථාව කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ජූජක නම් වූ එක්තරා බමුණෙක් රූමත් කාන්තාවක් සරණකර ගත්තේය. ඇයගේ ඉල්ලීම පරිදි මෙහෙකරුවන් සොයා යන ජූජක බමුණා වෙස්සන්තර තවුසා හමුවී දරුවන් දනට දෙන ලෙස ඉල්ලා සිටියේ ය. මේ වන විට මද්‍රී දේවිය පලවැල සොයා වනයට ගොස්ය. දරුවන් බියෙන් සැඟවෙද්දී ඔවුන් බමුණා හා යා නොහැකි බව කියමින්, වැළපෙද්දී වෙස්සන්තර තාපසතුමා දෙදරුවන් බමුණාට දන් දුන්නේය. ජූජක බමුණා විසින් තලා පෙළමින් සඳමහ රජුගේ රාජධානියට ගෙනයනු ලැබූ දරුවන් දෙදෙනා සඳමහ රජතුමා විසින් බමුණාට ඇතෙක් බරට වස්තුව ලබාදී නිදහස් කරගනු ලැබීය."

(i) මෙහි නාට්‍යමය අවස්ථා 02ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) මෙම නාට්‍ය රඟ දැක්වීමට සුදුසු චරිත 03ක් නම් කරන්න. (ලකුණු 03)
(iii) මෙම කථාවෙහි එන චරිත දෙකක් අතර ඇතිවන දෙබසක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

(05) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සමාරෝපය (ii) රූපණය (iii) අභිනය (iv) නළු වරණය

(1කට 5 බැගින් ලකුණු 10) (II කොටස ලකුණු 30 යි.)